# පැරණි පුවත්පත් මතකයන්

# මානිගෙ තීරුව

පොදුජන එක්සත් පෙරමුණ දකුණ ජයගත් දාට පසු දා මම මගේ මිත්‍ර එක්සත් ජාතික පාක්ෂිකයෙකු හමුවීමට ඔහු ගේ කාර්යාලයට ගියෙමි.

මගේ මිත්‍රයා එජාපය දකුණ දිනුවාක් වැනි ආඩම්බරයකින් සිය පුටුවේ වාඩි වී සිටියේ ය. කාර්යාලීය සගයින් ඔහු වට කර ගෙන එජාපය පරාජය වීමට හේතු විමසමින් සිටි අතර, මිත්‍රයා බැරෑරුම් පෙනුමක් ඇතිව ඔවුන්ට තතු පහදා දෙනු මට දැක ගත හැකි විය. ඔහු කතා කරන අතරතුර පත්තරයක් ගෙන පවන් සලන්නට වූයෙන් අවට සිටි එකෙක් වහා ගොස් විදුලි පංකාව ක්‍රියාත්මක කළේ ය. දිගින් දිගටම කතා කිරීම නිසා ඔහුගේ කටහඬ බැරැන්ඩි වත් ම තවෙකෙක් දුව ගොස් තේ කෝප්පයක් හා සිගරැට් පැකට්ටුවක් ගෙනාවේ ය. මිත්‍රයා කතා කරන අතර සිය පසුම්බිය දිග හැර බැලූ විට දෙදෙනෙක් ම සිට පසුම්බි අතට ගෙන ඔහුට මුදල් අවශ්‍යදැයි විමසූහ.

"තමුසෙට දැන් කන්තෝරුවෙ මාර සැලකිල්ලක්නෙ තියෙන්නෙ?" මම මිත්‍රයාට කියා සිටියෙමි. "කොහොමද එක පාරටම ඔච්චර තත්වයක් හදාගත්තෙ?"

"ඇත්තම කියනවා නම් මේක මහන්සි වෙලා ගොඩනගා ගත්ත දෙයක් නොවෙයි." මිත්‍රයා නිහතමානීව කියා සිටියේ ය.

"අද කන්තෝරු ආවට පස්සෙ ඉබේම ලැබිච්ච දෙයක්"
"ඒ කොහොමද ඒ?"

"උදේ මම එනකොට මේ කට්ටිය ඡන්දෙ ගැන කතා කර කර හිටියා. කවුරුත් මට මේ වගේ අමතු සැලකිල්ලක් පෙන්නුවේ නෑ." ඔහු මට කියා සිටියේ ය.

"ඉතින් මමත් ගියා ඡන්ද කතා බහ කරන තැනට. ගිහින් මම කිව්වා රට පෙරමුණට ගියත් මම යූ.එන්.පී කියලා"

"ඉතින් මොකද වුණේ?" උඩට ගත් හුස්ම පහළට හෙළා ගත නොහැකිව මම ඔහුගෙන් ප්‍රශ්න කෙළෙමි." කට්ටිය වටකරගෙන තමුසෙට ගැහැව්වද?"

"විකාර හැමෝම කවදාවත් දැකලා නැති මිනිහෙක්ව දැක්ක වගේ මගේ දිහා පුදුමෙන් බලන්නට පටන් ගත්ත."

ඔහු සිට අත්දැකීම විස්තර කරමින් කියමින් විය. "ඊළඟට හැමෝම මාව ආසාවෙන් අත ගාන්නයි, බදා ගන්නයි, ඉඹින්නයි පටන් ගත්ත."

"තමුසෙලා ගෙ කන්තෝරුවේ ඔක්කොම යූ.එන්.පී කාරයෝ කියලා මං දැනගෙන හිටියේ නැහැනේ."

"නෑ නෑ හුඟ දෙනෙක් යූ.එන්පී විරෝධී කට්ටිය. ඒ වුණාට අද දවසට ඒ ගොල්ලන්ට එක යූ.එන්.පී කාරයෙක්වත් හම්බු වෙලා නෑ මාව හම්බු වෙනතුරු." ඔහු මට පැහැදිලි කරන්නට විය. "පාන්දර දෙකහමාර වෙනතුරු ම යූ.ඇන්.පී කාරයෝ ඉඳල තිවෙනවා. පාන්දර හතරාමාරට පස්සෙ ඔක්කොම හතරාමාරේ පෙරමුණේ."

"ඒ කතාව පැත්තකට දාමු." මම මිත්‍රයාට කියා සිටියෙමි.

"ඡන්ද ප්‍රතිඵල ගැන තමුසෙට මොකද කියන්න තියෙන්නෙ?"

"අපි ඡන්දේන පරාද තමයි." මිත්‍රයා උපේක්ෂ සහගතව කියා සිටියේ ය. "ඒ වුණාට දකුණේ ඉන්න කෙළින් මිනිස්සු කියලා අපි පිළිගන්න ඕන."

"තමුසෙ කියන්නෙ යූ.ඇන්.පීය. පැරැද්දුව මිනිසුන් කෙළින් මිනිස්සු කියලද?"

"නෑ නෑ දකුණේ යූ.ඇන්පී කාරයෝ කෙළින් මිනිස්සු"
ඔහු මට කියා සිටියේ ය. "ඡන්දෙ පැරදුණා කියලා උන් අත පය අකුලගෙන හිටියේ නෑ. දිනපු එවුන්ගේ අඬුපඬු කැඩුවා"
මිත්‍රයා ගේ කතාව අසා මට මිත්‍රකම ද අමතක විය.
"තමුසෙ හරිම සවුත්තු මිනිහෙක්නෙ" මම ඔහුට කියා සිටියෙමි.

"තමුසෙ කියන්නේ යූ.ඇන්.පී කාරයෝ දිනපු මිනිස්සුන්ගේ අඬුපඬු කඩපු එක හරි කියලද?"
"මං ඒක හරියි කියන්නේ නෑ." මිත්‍රයා කියා සිටියේ ය. "ඒ වුණාට දකුණේ යූ.ඇන්.පී කාරයො රටට පෙන්නුව නියම යූ.ඇන්.පී කාරයෝ තාම ඉන්නව කියල."

ඉරිදා දිවයින 1994 අප්‍රේල් 03